ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිර්ණායකවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 13 හි 27 ඡේදය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් සාධාරණ අගයකට ගිණුම්ගත කළ යුතු වුවත් සංස්ථාව සතු වතු 16 න් වතු 15 කට අයත් හෙක්ටයාර් 9,960 ක් වූ ඉඩම වටිනාකම ගණනය කර වත්කම් ලෙස ගිණුම්ගතකර නොතිබුණි.	අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් රජයේ අයවැය ප්‍රතිපාදන මත අදියර කිහිපයකින් සංස්ථාවේ පාලනය යටතේ ඇති වතු මැණුම් කිරීමට කටයුතු කර ඇති අතර, ඒ අනුව ඉඩම්වල වටිනාකම පිලිබඳව අදහසක් ලබාගැනීමට රජයේ තක්සේරු වාර්තා ලබාදෙන ලෙස ඉල්ලීමක් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත සිදු කර තිබිණි. අමාත්‍යාංශය විසින් 2025 මැයි 15 දිනැති ලිපිය මඟින් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කරමින් මෙම වතු රජයේ වතු ගණයට අයත් වන හෙයින් සහන මිලක් අය කරමින් තක්සේරු කිරීමේ හැකියාව සොයා බලන ලෙස ඉල්ලීමක් සිදු කර තිබුණි.	සංස්ථාව සතු සියළුම ඉඩම් සාධාරණ වටිනාකමට ගිණුම්ගත කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 55 ඡේදය ප්‍රකාරව වත්කමක් භාවිතයට ගත හැකි අවස්ථාවේ සිට ක්ෂය කිරීම් සිදුකළ යුතු වුවත් ගෝමර තේ කර්මාන්තශාලාව සඳහා මිලදීගෙන තිබූ වර්ණ විභේදන යන්ත්‍රය (Colour Separate) 2023 මාර්තු 28 දින සිට නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කර තිබුණද යන්ත්‍රය සඳහා 2023 දෙසැම්බර් මාසයට පමණක් ක්ෂය	ගෝමර තේ කර්මාන්ත ශාලාවේ ස්ථාපනය කිරීම සඳහා චීනයෙන් ආනයනය කරන ලද Colour Separate යන්ත්‍රය ක්ෂය කිරීමේදී විගණන වාර්තාවේ පෙන්වා ඇති ආකාරයට 2023 වර්ෂයේ දෙසැම්බර් මස සඳහා පමණක් ක්ෂයට ගණනය කිරීම තුළින් 2023 වර්ෂය සඳහා අඩුවෙන් ක්ෂය ගණනය කිරීම අත්වැරදීමකින් සිදුවූවකි. එබැවින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 ට අනුකූලව නිවැරදිව ක්ෂය ගණනය කර එම	ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව ක්ෂය කළ යුතුයි.

	වෙන්කිරීම් සිදුකර තිබුණි. ඒ අනුව 2023 වර්ෂයට අදාළව රු. 2,169,966 ක් අඩුවෙන් ක්ෂය ගිණුම්ගත කර තිබුණි.	වරද 2025වසරේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.	
(ඇ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 හි 57 ඡේදය ප්‍රකාරව අස්ථිත්වයේ සේවා ප්‍රතිලාභ බැඳීම ගණනයේදී ආයුගණන ක්‍රමය යොදාගැනීම සිදුකළ යුතු නමුත්, ආයුගණන ක්‍රමය භාවිතා කර නොතිබූ බැවින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ රු.763,932,645ක් වූ සේවක ප්‍රතිලාභ බැඳීම් ශේෂයන්හි නිර්වද්‍යභාවය විගණනයේදී තහවුරු නොවීය.	සංස්ථාවේ සේවා ප්‍රතිලාභ බැඳීම ගණනය කිරීම සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19අනුව ආයුගණන ක්‍රමය භාවිතා කලයුතු වුවද ,මේ දක්වා එය සිදුකිරීමට නොහැකි වූයේ ආයුගණකඥවරයෙකුගේ (Actuary) හෝ ආයුගණකඥ ආයතනයක (Actuarial firm) සේවාව ලබාගැනීමට විශාල මුදලක් වැය කිරීමට සිදුවන බැවින් , ආයතනයේ පවතින මූල්‍ය දුෂ්කරතා මාධ්‍යයේ ඒ සඳහා විශාල මුදලක් වැය කිරීමට අපහසු වීම නිසාය .	සේවා ප්‍රතිලාභ බැඳීම් ගණනයේදී ප්‍රමිතිය ප්‍රකාරව ආයුගණන ක්‍රමය යොදා ගත යුතුය.
(ඈ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 21 හි 28 ඡේදය අනුව මූල්‍යම අයිතම පියවීමේදී පැන නඟින විනිමය වෙනස්කම් ඒවා පැන නගින කාලපරිච්ඡේදයේ ලාභය හෝ අලාභය තුළ හඳුනාගත යුතු වුවත් වර්ණ විභේදන යන්ත්‍රය (Colour Separate) මිලදී ගැනීමට අදාළව පැන නැඟුන හුවමාරු අගයේ වෙනස්කම මත වූ ලාභය 2023 වර්ෂයේදී රු. 137,618 ක් හා 2024 වර්ෂයේදී රු. 3,405,805 ක් මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගෙන නොතිබුණි.	Colour Separator යන්ත්‍රය ආනයන කිරීමට අදාලව පැණනැගුණු විදේශ විනිමය හුවමාරු ලාභය (Exchange gain) නිවැරදි ලෙස ආදායම් ප්‍රකාශනය තුල ගිණුම්ගත කර නොතිබීම අප අතින් සිදු වූ වරදක් වන අතර, 2025වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදි අවශ්‍ය ගැලපීම් සිදුකොට මෙම වරද නිවැරදි කිරීමට බලාපොරොත්තු වේ.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව කටයුතු කළ යුතුයි.
(ඉ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 41හි 12 හා 30 ඡේදයන්ට හා ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 3.1.4.2 අනුව පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් මූලික හඳුනාගැනීමේදී සහ සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදීම විකුණුම් සඳහා වියදම් අඩුකළ පසු සාධාරණ වටිනාකමට මැනිය යුතු බව දක්වා ඇතත්, සංස්ථාවේ වතු 14 ක් පුරා විහිදුනු දැව අස්වනු නෙළිය හැකි ගස් 104,691 ක් ඇතුළුව ග්‍රාන්ඩිස්, ඇල්බිසියා, තේක්ක, යුකැලිප්ටස් යනාදී වනවගාවන් සමාලෝචිත වර්ෂය අවසානයටද නිසි තක්සේරු කිරීමකින් තොරව හෝ සාධාරණ අගයකට අගය කිරීමකින් තොරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ	සංස්ථාවේ වතුයායන් සතුව ඇති වානිජමය වන වගාවන් මේ වන විට ලැයිස්තුගත කිරීම අවසන් කර ඇති අතර, එම වන වගාවන් තක්සේරු කිරීමේ කටයුතු මේ වන විට සිදුකරගෙන යමින් පවතී. දැනට මෙම තක්සේරු කිරීමේ කටයුතු ඕපල්ගල වතුයායේ ඇති වනවගාවන් තක්සේරු කිරීමට පමණක් සීමා වී ඇත. එබැවින් මේ අවස්ථාව වනවිට වන වගාවන්ගේ සත්‍ය වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගිණුම්ගත කිරීමට නොහැකි වී ඇත. මෙම කාර්ය සම්පූර්ණ කල පසු විකුණූ ගස්වල පිරිවැය ධාරක විද්‍යාත්මක ශේෂයෙන් අඩුකර පෙන්වීමට කටයුතු කරනු ලැබේ. සංස්ථාවේ ලෙජරයේ නැවත වන වගාව සඳහා දරණ ලද වියදම වන රු.48,388,411 ධාරක වන වගා වියදම් යටතේ පෙන්වා ඇති අතර නෙලීමට සුදුසු තත්ත්වයේ	මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් 3.1.4.2 දරණ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් සාධාරණ අගයට ගිණුම්ගත කළ යුතු අතර පරිණත හා පරිණත නොවූ ලෙස වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.

රු.3,362,969,544 ක් ලෙස ගිණුම්ගතකර තිබුණි. එසේම ප්‍රමිතයේ 43 ඡේදය ප්‍රකාරව පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් පරිණත හා පරිණත නොවූ වගාවන් ලෙස වෙන වෙනම ඉදිරිපත් කල යුතු වුවද 2020 සිට 2024 දක්වා කාලය තුල සිටුවා තිබූ විවිධ දැවමය ශාක 32,820 ක් පරිණත හා පරිණත නොවූ ලෙස දක්වා නොතිබුණි.	ගස්වල වටිනාකම රු.3,085,476,423 හා රු.මි. 229,104,709ක් පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් යටතේ පෙන්වා ඇත. එසේ වෙන වෙනම ගිණුම්වල පෙන්වා ඇති අගයන්වල එකතුව එක් අගයක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ පෙන්වා ඇති අතර ධාරක වන වගා සඳහා දරණ ලද වියදම මේ වන තෙක් පරිණත හා පරිණත නොවූ වශයෙන් වෙන්කිරීමක් සිදු කර නොමැත.	

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය ගණනය කිරීම් අනුව ගොඩනැඟිලි සඳහා රු. 218,769 ක් ක්ෂය වැඩියෙන් ද උපකරණ, ගෘහ භාණ්ඩ, මෝටර් රථ, පරිගණක හා යන්ත්‍ර සඳහා රු.1,038,206ක් ක්ෂය අඩුවෙන්ද ගිණුම්ගත කර තිබුණි.	ස්ථාවර වත්කම් ක්ෂය ගණනය කිරීමේදී සිදුව ඇති දෝෂ සඳහා බලපා ඇත්තේ සංස්ථාව සතුව නිවැරදි ස්ථාවර වත්කම් ලේඛණයක් නොමැති විමයි . නමුත්2025 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදිව ස්ථාවර වත්කම් ක්ෂය ගණනය කිරීමට බලාපොරොත්තු වන අතර, සිදුවී ඇති දෝෂයන් නිවැරදි කිරීමට ද අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ.	නිවැරදිව ක්ෂය ගණනය කර ගිණුම්ගත කළ යුතුයි.
(ආ)	ගෝමර තේ කර්මාන්තශාලාවේ 2024 ජූලි 15 දින තේ වියලන යන්ත්‍රයට හා ගොඩනැඟිල්ලට හානි වී තිබුණු අතර එම හානියේ වටිනාකම රු. 2,652,300 ක් ලෙස ඇස්තමේන්තු කර තිබූ අතර හානියට අදාළව රක්ෂණයෙන් රු.2,200,630 ක් ලැබී තිබුණි. ඒ අනුව වත්කම් හානියෙන් රු. 451,670 ක අලාභයක් හඳුනාගෙන තිබුණි. වත්කම් ඉවත් කිරීමට අදාළ මුළු අලාභය රු.45,386 ක් වුවත් වත්කම් ඉවත් කිරීමේ අලාභය රු. 451,670 ක් ලෙස දැක්වීමෙන් සංස්ථාවේ ලාභය රු.406,284 කින් ඌණගණනය වී තිබුණි.	ගෝමර කර්මාන්තශාලාවේ තේ වියලන යන්ත්‍රයට සිදුවූ අලාභය නිවැරදිව ගණනය කර නොමැති අතර අප විසින් හානිය ලෙස ගණනය කර ඇත්තේ ගින්නෙන් සිදු වූ හානියේ වටිනාකම ලෙස ඇස්තමේන්තු කර තිබූ රු.2,652,300 සහ ලැබූ රක්ෂණ මුදල වන රු.2,200,630 අතර වෙනස වන රු.451,670 ය. මෙම අලාභය ගණනය කිරීමේ දී සිදුව ඇති දෝෂය 2025 වර්ෂයේ අවසාන ගිණුම් පිළියෙල කිරීමේ දී නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. එසේම මෙම හානි වූ යන්ත්‍රයේ ක්ෂය ගණනය කිරීමේ දෝෂය ද 2025 වර්ෂයේ නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.	අලාභය නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතුයි.

(ඇ)	2024 වර්ෂය තුළදී වලහන්දුව වතුයායේ රබර් ගස් 1007 ක් ටෙන්ඩර් කැඳවා රු.3,791,359ක මිලකට අලෙවිකර තිබුණද එහි පිරිවැය ධාරක ජීව විද්‍යාත්මක ශේෂයෙන් අඩුකර නොතිබුණු නිසා වත්කම් අධිගණනය වී තිබුණි.	වලන්දුව වතුයායේ ඇති රබර් ගස් සඳහා මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂය වර්ෂ 2000 පමණ සිට පැවත එන පැරණි ශේෂයකි. තවද , මෙසේ කපා ඉවත් කරන ලද රබර් ගස් වසර 30 කටත් වඩා පැරණි බැවින්ද, එම ගස් පිළිබඳව එම වතුයාය සතුව නිවැරදි දත්තයන් ද නොමැති වීම හේතුවෙන් ද කපා ඉවත් කරන ලද රබර් ගස්වල පිරිවැය නිවැරදිව හඳුනාගෙන ධාරක ජීව විද්‍යාත්මක ශේෂයෙන් අඩුකර පෙන්වීමට නොහැකි වීමට හේතු විය .	ධාරක ජීව විද්‍යාත්මක වත්කම්වල පිරිවැය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුයි.
(ඈ)	සමාලෝචිත වර්ෂයේදී ගස් විකිණීමෙන් රු.141,951,100 ක ආදායමක් උපයා තිබුණද එහි පිරිවැය හඳුනාගෙන වර්ෂයේ පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් ශේෂයෙන් අඩුකර නොතිබුණු බැවින් පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් ශේෂය අධි ගණනය වී තිබුණි.	සමාලෝචිත වර්ෂයේ දී ගස් විකිණීමෙන් රු.141,951,100 ක ආදායමක් උපයා ගනු ලැබුව ද එම ගස්වලට අදාල පිරිවැය සංස්ථාවේ පාරීභෝජ්ය විද්‍යාත්මක වත්කම් ශේෂයෙන් අඩුකර පෙන්වීමට නොහැකි වී ඇත්තේ වතු යායවල් සතුව නිවැරදි තොරතුරු නොමැති වීම නිසයි.	පාරිභෝජ්‍ය ජීව විද්‍යාත්මක වත්කම් සාධාරණ අගයට ගිණුම්ගත කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ පාරිතෝෂික වෙන්කිරීම් ශේෂය සහ වර්ෂය තුල ගෙවන ලද පාරිතෝෂික වියදමද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල වෙනම ගලපා තිබුණු අතර ගෙවිය යුතු පාරිතෝෂික වටිනාකමෙන් පසුගිය වර්ෂයේ ශේෂය සමඟ වෙනස වූ රු.41,025,510 ක වෙනස කාරක ප්‍රාග්ධන වෙනස්වීම් තුලින් ගලපා තිබුණි.	අප විසින් විගණන වාර්තාවේ සඳහන් කර ඇති කරුණු අප විසින් නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ගිණුම්ගත කර ඇති බව අපගේ විශ්වාසයි. නමුත් අපගේ ගිණුම්කරණයේ අඩුපාඩුවක් ඇතොත් එය නිවැරදි කර ගැනීමට අපහට උපදෙස් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමු.	මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කළ යුතුය.
(ඊ)	සංස්ථාවේ 2024 වර්ෂයේ බදු කුලී ආදායම රු.1,252,504 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම නිසා එම ප්‍රමාණයෙන් සංස්ථාවේ ලාභය අඩු වී තිබුණු අතර ලැබිය යුතු බදු කුලී ආදායම ද එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි.	ඉඩම් අංශය විසින් මූල්‍ය අංශය වෙත ලබාදෙන තොරතුරු අනුව, මූල්‍ය අංශය විසින් ලැබිය යුතු බදු ආදායම් සඳහා ඉන්වොයිස්පත් නිකුත් කර ගිණුම් ගත කරනු ලැබේ. කෙසේ වෙතත් බදු දී ඇති දේපොළ වලින් ලැබිය යුතු බදු කුලී ආදායම් පිළිබඳව රජයේ විගණන අංශය වෙත ඉඩම් අංශය විසින් 2024 ඔක්තෝබර් 03 දින ලබා දී ඇති ලේඛණයේ දෝෂ පැවති බැවින් නැවත එය නිවැරදි කිරීමට ද කටයුතු කර ඇත.	බදු කුලී ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(උ)	2024 දෙසැම්බර් 31 දිනට වතුයායන්හි වෙළඳ හා ණයගැති ශේෂය තුල ප්‍රධාන කාර්යාලය සහ වතු අතර, ප්‍රාදේශීය කාර්යාලය සහ වතු අතර හා වතුයායන් අතර භාණ්ඩ හුවමාරු කරගැනීම සඳහා පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් තුල එකිනෙකට හිලව් නොවූ	වතුයායන්හි වෙළෙඳ හා ණයගැති ශේෂය තුළ ප්‍රධාන කාර්යාලය හා වතුයායන් අතර ද, ප්‍රාදේශීය කාර්යාලය හා වතුයාන් අතර ද ඇතිවන ගනුදෙනු සටහන් කිරීම සඳහා පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් තුළ එකිනෙකට හිලව් නොවූ ශේෂයන් අතරින් (2024.12.31 දිනට රු.166,412,556) වැඩිම	ජංගම ගිණුම් ශේෂයන් නිවැරදිව හිලව් කිරීමට කටයුතු කළ යුතුය.

රු.166,412,556 ක ශේෂයක් පැවතුනි. ඒ තුල වර්ෂයකට වැඩි රු.7,963,019,263 ක් වූ හර ශේෂයක් හා රු. 7,525,771,264 ක් වූ බැර ශේෂයක් විය. වතු ජංගම ගිණුමේ (Estate C/A Balance) හර ශේෂය තුල 2019 හා 2020 වර්ෂ වලට අදාලව වතුයායන් අතර පවතින ගනුදෙනු සටහන් කිරීමේදී අවශ්‍ය ජනල් සටහන් ඇතුලත් නොකිරීම හේතුවෙන් ඉතිරි වූ රු. 1,681,780,263 ක ශේෂයක් පැවතිනි. එය මෙතෙක් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

ප්‍රමාණයක් ඇත්තේ පැරණි හිලව් නොවූ ශේෂයන්ය. මේ අතරින් 2019 හා 2020 වසරවලට අදාළව පවතින රු.1,681,780,263 ක ශේෂයෙන් යම් ප්‍රමාණයක් පිළිබඳව වැඩිදුරටත් සොයා බලා ඒවාට අදාළ ජර්නල් සටහන් යොදා එම හිලව් නොවූ ශේෂයන් අඩු කිරීමට 2025 වසරේ දී කටයුතු ද කිරීමට අපේක්ෂා කෙරේ.

1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විෂයය	මුල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.	අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.	වෙනස රු.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
දේපළ පිරියත උපකරණ	504,307,691	380,289,813	124,017,878	මෙම වෙනසට හේතු වී ඇත්තේ දීර්ඝ කාලයක් තිස්සේ නිවැරදි ස්ථාවර වත්කම් ලේඛණයක් සංස්ථාව සතුව නොතිබීමයි. රේඛිය අමාත්‍යාංශයේ ද සහයෝගය ඇතිව අංග සම්පූර්ණ නිවැරදි ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කිරීම මේ වන විට සංස්ථාව විසින් අරබා ඇති අතර එහි ප්‍රථම අදියර වශයෙන් කැළෑබොක්ක වතුයායේ ස්ථාවර වත්කම් (ගෘහ භාණ්ඩ හා උපකරණ, පරිගණක යන්ත්‍ර) ලැයිස්තුගත කිරීම ආරම්භ කරන ලදී. මෙම ස්ථාවර වත්කම් භෞතික සත්‍යාපන කටයුතු සිදුකරනු ලැබුවේ ආයතනයේම නිළධාරීන් බැවින්, දෛනික රාජකාරී වලට අමතරව මෙම කටයුත්තේ ද නියැලීම නිසා ඔවුන්ට මෙම කාර්යය නිම කිරීමට නොහැකි විය.	වත්කම්වල වෙනස පිළිබඳ පරීක්ෂා කර නිවැරදි කරගත යුතු අතර ස්ථාවර වත්කම් ලේඛණයක් සැකසීමට කටයුතු කළ යුතුය.

1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විෂයය	මුදල රු.	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ආපසු ගෙවිය යුතු තැන්පතු	28,751,363	ගෙවිය යුතු තැන්පතුකරුවන්ගේ ලේඛණ සහ ශේෂ සනාථ කිරීම්	ආපසු ගෙවිය යුතු තැන්පතු සඳහා අප විසින් මුදල් ගෙවනු ලබන්නේ අදාළ පුද්ගලයන් එම මුදල් ගෙවන ලෙස ඉල්ලීමක් කළ පසු ඔවුන් සතු රිසිට්පත් පරීක්ෂා කිරීමෙන් අනතුරුවය. ආපසු ගෙවිය යුතු තැන්පතුවලට අදාළ විස්තර ඇතුළත් කොට වෙනම ලේඛණයක්/ ලැයිස්තුවක් පවත්වාගෙන නොගිය ද, එම විස්තර ලෙජරයේ නිසි පරිදි සටහන් කොට ඇත. එම ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂයන් ගෙවිය යුත්තේ කාටද යන්න ඇතුළු අනෙකුත් තොරතුරු ලෙජරය තුලින් ලබාගෙන ලැයිස්තුවක් සෑදීමට විශාල කාලයක් වැය වේ. නමුත් ප්‍රසම්පාදන අංශය විසින් ගෙවියයුතු තැන්පතුවලට අදාළ තොරතුරු සටහන් කිරීමට වෙනම ලේඛණයක් පවත්වාගෙන යාමට මේ වන විට කටයුතු කරමින් පවතී.	ආපසු ගෙවිය යුතු තැන්පතු ලේඛණයක් සැකසිය යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රධාන කාර්යාලයේ සහ වතුවල රු. 348,085,497 ක් වූ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු ශේෂයෙන් වසර 05 ඉක්මවා තිබුණු රු.58,872,707 ක ශේෂය අයකර ගැනීමට සංස්ථාව අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය.	විගණන වාර්තාවේ දක්වා ඇති වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ ශේෂයේ අන්තර්ගත ප්‍රධාන අයිතමයක් වන්නේ ජනතා වතු සංවර්ධණ මණ්ඩලයෙන් අප සංස්ථාවට ලැබිය යුතු රු. 42,739,676 කි. එම ආයතනය වෙත සංස්ථාව විසින් ගෙවිය යුතු රු.මි. 97,709,346 ක් ඇති බැවින්, සංස්ථාව විසින් ජනවසම වෙත රු.54,696,666 ක මුදලක් ගෙවිය යුතු වේ. මෙම ගණුදෙනු සම්බන්ධව දිගින් සාකච්ඡා සිදුකර ඇති අතර අප ආයතනයට ජනවසමෙන් ලැබිය යුතු ශේෂය සඳහා 2012 වර්ෂයේදී අඩමාණ ණය මුදලක් ද වෙන්කර ඇති අතර අනෙකුත් ණය මුදල්ද අය කර ගැනීමට කටයුතු කරමින් පවතී.	දිගුකාලීන ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.

1.6.2 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු, ශේෂය වූ රු.479,620,080 න් වර්ෂ 05 කට වඩා පැරණි රු. 253,147,140 ක	මෙම වසර 12 කට වඩා පැරණි ශේෂයන් සම්බන්ධයෙන් අප විසින් ණය කපාහැරීම සඳහා ආයතන වලින් ඉල්ලීම් කරඇතත් ඒ සඳහා එකඟ වීනොතිබුණි. 01. හලාවත වැවිලි සමාගම - රු.42,810,959	ගෙවිය යුතු ශේෂ හා පොලිය නිරවුල් කර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.

ශේෂයක් වූ අතර ඒ තුල වර්ෂ 12 කට පෙර සිට පවතින රු.219,546,538 ක ශේෂයක් විය. එය ගෙවිය යුතු ණයහිමි ශේෂයෙන් සියයට 46ක් විය.

02. ලංකා මිනරල් සෑන්ඩ්ස් සමාගම - රු. මිලියන 25
03. ලංකා පොහොර සමාගම - රු. මිලියන 35.93
04. ජනතා වතු සංවර්ධන මණ්ඩලය - රු.97,709,346
05. රාජ්‍ය සම්පත් කළමණාකරණ සංස්ථාව - රු.28,709,029.00

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදලේ 15 හා 16 වන වගන්තිය	2000 සිට 2024 වර්ෂය දක්වා ගෙවිය යුතු රු.695,690,845ක සේවක අර්ථසාධක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර ඒ මත ගෙවිය යුතු අධිභාරය 2024 දෙසැම්බර් 31 දිනට රු.85,854,420ක් විය. ඉහත අරමුදලට දායක නොවන වතු සේවකයින් වතු කාර්යමණ්ඩලයේ අර්ථසාධක අරමුදල (ESPS) වෙත ගෙවිය යුතු දායක මුදල රු.89,799,721ක්ද, වතු කළමනාකරුවන් ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සංගමය (CPPS) වෙත ද ගෙවිය යුතු මුදල රු.21,984,422 ක්ද විය.	කාලයක් තිස්සේ සංස්ථාවේ පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් ඉහත සඳහන් හිඟ ව්‍යවස්ථාපිත (EPF, ETF, ESPS, CPPS, Gratuity) ගෙවීම් නියමිත පරිදි සිදුකිරීමට නොහැකි විය. හිඟ ව්‍යවස්ථාපිත ගෙවීම් සම්බන්ධව 2025 වසරේ මාර්තු මස කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කොට ඇත. මේ සම්බන්ධව අධ්‍යයනය කොට නිර්දේශ ලබා දීම සඳහා කමිටුවක් පත් කොට ඇති අතර එම නිර්දේශ අනුව කැබිනට් මණ්ඩලය විසින් ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් සිදුකිරීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබාදෙන්නේ නම් සම්පූර්ණයෙන්ම හිඟ ව්‍යවස්ථාපිත මුදල් ගෙවීමට බලාපොරොත්තු වේ.	හිඟ දායක මුදල් පිළිබඳ ගැටළුව කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	1980 අංක 46 දරන සේවා නියුක්තිකයන් ගේ භාරකාර අරමුදල් පනතේ 02 වන කොටසේ 16 (1) ඡේදය	2000 සිට 2024 වර්ෂය දක්වා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සඳහා ගෙවිය යුතු දායක මුදල රු.47,537,485 ක් වන අතර ඒ මත ගෙවිය යුතු අධිභාර මුදල රු. 10,425,561 ක් විය.	කාලයක් තිස්සේ සංස්ථාවේ පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් ඉහත සඳහන් හිඟ ව්‍යවස්ථාපිත (EPF, ETF, ESPS, CPPS, Gratuity) ගෙවීම් නියමිත පරිදි සිදුකිරීමට නොහැකි විය. සංස්ථාව ඇතුළුව රාජ්‍ය ආයතන තුනක හිඟ ව්‍යවස්ථාපිත ගෙවීම් සම්බන්ධව 2025 වසරේ මාර්තු මස කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කොට ඇත.	හිඟ දායක මුදල් පිළිබඳ ගැටළුව කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

(ඇ)	1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ II වන කොටසේ 5 (1) වගන්තිය	2010 සිට 2024 වර්ෂය දක්වා වතු සේවකයින් සඳහා රු.583,316,046 ක් ද ප්‍රධාන කාර්යාලයේ සේවකයින්ට රු.4,911,149 ක්ද වශයෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු මුළු පාරිතෝෂික මුදල රු.588,227,195 ක් වූ අතර ඒ මත ගෙවිය යුතු අධිභාර මුදල රු. 27,777,163 ක් විය.	කාලයක් තිස්සේ සංස්ථාවේ පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් ඉහත සඳහන් හිඟ ව්‍යවස්ථාපිත (EPF, ETF, ESPS, CPPS, Gratuity) ගෙවීම් නියමිත පරිදි සිදුකිරීමට නොහැකි විය. සංස්ථාව ඇතුළුව රාජ්‍ය ආයතන තුනක හිඟ ව්‍යවස්ථාපිත ගෙවීම් සම්බන්ධව 2025 වසරේ මාර්තු මස කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කොට ඇත.	පනත ප්‍රකාරව ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 18(1) වගන්තිය හා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(2) වගන්තිය	පනත ප්‍රකාරව 2018 සිට ඉන්වොයිස් පත්‍ර ඉදිරිපත් කල වර්ෂ 6 ක විගණන ගාස්තු රු.6,585,858 ක් ද, 1998 සිට 2017 වර්ෂ සඳහා වූ විගණන ගාස්තු රු.6,393,289 ක් ද ගෙවා නොතිබුණි.	2017, 2018, 2019 සහ 2020 වර්ෂවලට අදාළ විගණන ගාස්තු ගෙවිය යුතු විගණන ගාස්තු ලෙස ගිණුම් ගත කර ඇත. 2021 සහ 2022 වසරවලට අදාළ විගණන ගාස්තු ගෙවීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් ලබාගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. එහිදී අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය වී ඇත්තේ, ආයතනයේ පවතින මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් එම ගෙවීම් නොකරන ලෙසයි. එබැවින් විගණන ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් නැවත වරක් අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් ලබාගැනීමට අපේක්ෂා කරමු.	විගණන ගාස්තු ගෙවීමට කටයුතු කළ යුතුය.
(ඉ)	2018මාර්තු 19 දිනැති අංක 2018/01දරන වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 2 (අ) ඡේදය සහ 2015ජූලි 10 දිනැති අංක 2015/02දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය	ආයතනය සතු වාහන 122 න් 74 ක් ම එනම් සියයට 61 ක්ම ධාවන තත්ත්වයේ නොමැති අතර ඒවායින් වැඩි ප්‍රමාණයක් වර්ෂ 8 – 14 කට පෙර සිටම ධාවන තත්ත්වයේ නොතිබුණු වාහන විය. 2024 පැවති පොදු ව්‍යාපාර කමිටුව මඟින් ද වාහන අපහරණය කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස දන්වා තිබුණ ද 2025 මැයි 31 වන විටත් එම වාහන අපහරණය කර නොතිබුණි.	අප ආයතනය සතු වාහන 74 ක් අපහරණය කිරීම සඳහා යෝජිතය. අපහරණය කිරීමට සුදුස වාහන හඳුනාගැනීමේ විශේෂ සමීක්ෂණ මණ්ඩල හා හඳුනාගත් වාහන තක්සේරු කිරීම සඳහා දිස්ත්‍රික් අනුව මණ්ඩල / කමිටු පත් කර ඇත.	චක්‍රලේඛ ප්‍රකාරව ධාවන ත්ත්ත්වයේ නොමැති වාහන අපහරණය කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.

(ඊ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ.756 (2) (ආ)	භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයට අදාල බඩු බාහිරාදිය භාර නිලධාරියා හෝ ආසන්නතම නිලධාරීන් පත්කල නොහැකි වුවද වතුයායන්හි භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල සඳහා අදාල වතුයායේ වතු අධිකාරි පත්කර තිබුණි. භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් භාණ්ඩ භෞතිකව පරීක්ෂාවට ලක් නොකර ඉකුත් වර්ෂයේ සමීක්ෂණ වාර්තා පිටපත් ලබාගෙන අත්සන් තබන ලද අවස්ථා නිරීක්ෂණය විය.	භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ බඩු බාහිරාදිය භෞතිකව පරීක්ෂා කිරීම සඳහා සම්ප්‍රදායිකව වැවිලි ක්ෂේත්‍රයේ වතුයායන්හි පත් කරනු ලබන්නේ අදාල වතුයායේ වතු අධිකාරි සහ වෙනත් නිළධාරීන් දෙදෙනෙකුය. මෙය රාජ්‍ය වැවිලි සංස්ථාවේ වතුයායන් තුල පසුගිය වසර 50 ක පමණ කාලයක සිට සිදු කරනු ලබන ක්‍රමවේදයයි. මෙයට වෙනස් ක්‍රමයක් අනුගමනය කළයුතු වන්නේ නම් ඒ සඳහා එම උපදෙස් ලබාදී චක්‍රලේඛනයක් එවිය යුතු වන්නේ ය.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 68,640,456 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු. 92,673,903 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලය පෙර වර්ෂයට සාපේක්ෂව රු.24,033,447 ක වර්ධනයක් පැවතුණි. මෙම වර්ධනය සඳහා පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ වෙනත් ආදායම් රු. 57,442,896 කින් වැඩිවීම හා පරිපාලන වියදම් හා මූල්‍ය වියදම් පිළිවෙලින් රු. 29,840,866 කින් හා රු. 13,174,092 කින් අඩුවීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත පරිදි වේ.

	2024 (රු)	2023 (රු)	විචලනය (රු)	විචලනයේ ප්‍රතිශතය %
අයභාරය	991,042,009	1,012,615,844	(21,573,835)	(2)
මූල්‍ය හා අනෙකුත් ආදායම්	192,316,491	135,743,884	56,572,607	42
විකුණුම් පිරිවැය	969,188,394	915,210,110	53,978,284	6
පරිපාලන වියදම්	222,934,082	252,774,948	(29,840,866)	(12)
මූල්‍ය වියදම්	59,876,479	73,048,571	(13,172,092)	(18)

2.3 අනුපාත විශ්ලේෂණය

(අ) සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය පිළිවෙලින් 0. 24 : 1ක් සහ 0.17 : 1 වූ අතර ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 0.19 : 1ක් සහ 0.13 : 1 ක් විය. සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂයන්හි වටිනාකම පිළිවෙලින් රු. 2,178,669,294 ක් හා රු. 2,156,877,357 ක් වී ජංගම වගකීම් වටිනාකම ඉහළ ගොස් තිබීම, ජංගම වත්කම් හා ක්ෂණික වත්කම් අනුපාතයන්හි පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) 2023 හා 2024 වර්ෂයන්හි දළ ලාභ අනුපාතය පිළිවෙලින් සියයට 10 ක් හා සියයට 2.2 ක් වී තිබුනු අතර 2023 වර්ෂයේ පැවති සියයට 9.2 ක ශුද්ධ අලාභ අනුපාතය සමාලෝචිත වර්ෂයේ දී සියයට 6.93 ක ශුද්ධ අලාභ අනුපාතයක් දක්වා අඩු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සංස්ථාවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන හා මානව සම්පත්) තනතුර සඳහා බාහිර අයදුම්කරුවන් බඳවාගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම වන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත් මානව සම්පත්/ ව්‍යාපාර පරිපාලනය/ ව්‍යාපාර අධ්‍යයනය /ව්‍යාපාර කළමනාකරණය / රාජ්‍ය පරිපාලනය/ කළමනාකරණය / වාණිජ්‍ය / රාජ්‍ය කලමනාකරණය පිළිබඳ ප්‍රථම උපාධිය සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් වුවද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ප්‍රථම උපාධිය නොමැති විශ්‍රාමික ගුවන් හමුදා නිලධාරියෙකු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන හා මානව සම්පත්) තනතුරට පත්කර තිබුණි.	මානව සම්පත් පිළිබඳ ව්‍යාපාර පරිපාලන මූලික උපාධිය (BBA in HRM) 2010 වර්ෂයේ දී ඉන්දියාවේ ජවහාර්ලාල් ජාත්‍යන්තර අධ්‍යාපන පර්යේෂණ ආයතනය මගින් සම්පූර්ණ කර ලබාගත් උපාධි සහතිකයෙහි, ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය මගින් සත්‍යාපනය කරන ලද පිටපත මේ සමග අමුණා ඇති අතර මොහු ආරක්ෂක කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය (Pg Dip in Def. Mgt) 2015 වර්ෂයේ දී ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය මගින් ද මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය (Pg. Dip. in HRM) 2016 වර්ෂයේ දී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් ද 2017 වර්ෂයේ දී මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනපති (MBA in HRM) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් ද සම්පූර්ණ කර ඇත.	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන හා මානව සම්පත්) තනතුර සඳහා අපේක්ෂිත සුදුසුකම් සපුරා ඇති නිලධාරියෙකු බඳවා ගත යුතුය.
(ආ)	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වතු කාර්යමණ්ඩලය සඳහා නිලධාරීන් 30 දෙනෙකු 2024 මැයි 05 දින සිට බඳවාගෙන තිබුණි. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සහ වතු සේවක වෘත්තීය සමිති සමඟ වූ 2022 ඔක්තෝබර් 01 සිට 2025 සැප්තැම්බර් 30 දක්වා වූ වසර 03 ක සාමූහික ගිවිසුමට (Collective Agreement) අනුව වතු කාර්යමණ්ඩලයේ වැටුප	වතු කාර්ය මණ්ඩලයට පරිපාලන සහ මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය වන අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර එම අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාවේ පුරප්පාඩු වී ඇති සේවකයින් පමණක් පුවත්පත් දැන්වීම් පල කර සුදුසුකම්ලත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් හරහා නියමිත ක්‍රමවේදයට අනුව අදාල සුදුසුකම් හා පළපුරුද්ද සහිත අපේක්ෂකයින් පමණක් බඳවා ගෙන ඇත. විවිධ තනතුරු සඳහා නිලධාරීන් 15 දෙනෙකු බඳවා ගැනීමේදී සාපේක්ෂව	සාමූහික ගිවිසුමට අනුව වතු කාර්යමණ්ඩල වැටුප තීරණය කළ යුතුය.

	තීරණය කර තිබුණු අතර ඊට අනුව බඳවා ගැනීම සිදුකල යුතුය. එසේ වුවද වතු කාර්යමණ්ඩලයට බඳවා ගත් 30 දෙනාගෙන් 15 දෙනෙකුට සාමූහික ගිවිසුමෙහි සඳහන් වැටුපට වඩා වැඩි වැටුපක් තීරණය කර 2024 මැයි සිට ගෙවා තිබුණි. මේ නිසා නියමිත වැටුපට වඩා රු. 256,375 ක් එක් මාසයකට වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.	අවම වැටුපක් සාමූහික ගිවිසුමෙහි සඳහන් වන අතර එම ක්ෂේත්‍රයේ රැකියා සඳහා පවතින අධික වෙළඳපල ඉල්ලුම මත සුදුසු වැටුප් තලයක නොපිහිටුවවහොත් ඉහත රැකියා සඳහා සුදුසුකම්ලත් සහ ක්ෂේත්‍රයේ පළපුරුදු අයදුම්කරුවන් කිසිවෙකුත් බඳවා ගැනීමට නොහැකි තත්වයක් නිරීක්ෂණය වී ඇත. එබැවින් පරිපාලන නිලධාරි, සහකාර ක්ෂේත්‍ර නිලධාරී, කර්මාන්තශාලා නිලධාරී, ක්ෂේත්‍ර නිලධාරී, කණිෂ්ඨ වතු වෛද්‍ය නිලධාරී, ජ්‍යෙෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරී තනතුරු සඳහා සුදුසුකම්ලත් සහ ක්ෂේත්‍රයේ පළපුරුදු අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා එහිදී ඔවුන්ගේ ක්ෂේත්‍රයේ පළපුරුද්ද, සුදුසුකම් හා එම ක්ෂේත්‍රයේ ලබාගත් වැටුප් විස්තර සලකා බලා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ මත ඔවුන්ව සුදුසු වැටුප් තලවල පිහිටුවා සේවයේ අත්‍යවශ්‍යතාවය සැලකිල්ලට ගෙන බඳවා ගැනීමට කටයුතු කරන ලදී.	
(ඇ)	ක්ෂේත්‍ර නිලධාරීන් බඳවාගැනීම සම්බන්ධයෙන් 2024 පෙබරවාරි 13 දින පුවත්පත් දැන්වීමට අනුව ක්ෂේත්‍ර නිලධාරියෙකුට තිබිය යුතු පළපුරුද්ද ලෙස ප්‍රාදේශීය වතු සමාගමක් හෝ රජයට අයත් වතුයායක සහකාර ක්ෂේත්‍ර නිලධාරි තනතුරක වසර 03 කට වැඩි පළපුරුද්දක් තිබිය යුතු බව සඳහන් වුවද ක්ෂේත්‍ර නිලධාරීන් ලෙස 2024 මැයි 20 දින පත්වීම් ලබාදුන් 06 දෙනාගෙන් 04 දෙනෙකුම ආරක්ෂක සේවයේ (ශ්‍රී ලංකා ගුවන් හමුදාව) යෙදී සිට විශ්‍රාම ගිය පුද්ගලයන් වන අතර ඔවුන් ඉහත පළපුරුද්ද සපුරා නොතිබුණි.	ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වලහන්දුව රාජ්‍ය වතුයායේ අනවසරයෙන් ඉඩම් අල්ලාගැනීම සීඝ්‍රයෙන් ඉහළ ගොස් වතු අධිකාරීට හා එහි කාර්ය මණ්ඩලයට ඇතිවූ මරණීය තර්ජන හේතුවෙන් එම වතුයායේ පාලනය ආයතනයෙන් ගිලිහී ගොස් තිබීම හේතුවෙන් එම වතුයායේ ඉඩම් හා නිළධාරීන්ගේ ආරක්ෂාව සලසා ගැනීම පිණිස මෙවන් තත්වයක් මත වතුයායේ පාලනය ස්ථාපිත කිරීම පිණිස ඇති එකම විකල්පය ලෙස විශ්‍රාමික හමුදා නිළධාරීන් බඳවා ගෙන ක්ෂේත්‍ර රාජකාරියේ යොදවා වතු කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව සහතික කොට පරිපාලනය යථාවත් කිරීම පිණිස ඉහළ කළමණාකාරීත්වයේ මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයේද අනුමැතිය සහිතව කටයුතු කරන ලදී.	අදාළ බඳවාගැනීමේ පටිපාටියෙහි සඳහන් සුදුසුකම් පරිදි බඳවා ගැනීම් සිදුකළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ කාරක ප්‍රාග්ධනය රු.1,655,781,536 ක සෘණ අගයක් ගෙන තිබුණි. එසේම රු.2,181,121,788 ක් වූ ජංගම වගකීම් තුළ එකතුව රු.1,443,249,668 ක දිගුකාලීනව ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම්	ආයතනය තුළ දීර්ඝ කාලයක සිට පවතින මූල්‍ය දුෂ්කරතා හමුවේ සේවක ව්‍යවස්ථාපිත ගෙවීම් ද ඇතුළුව දිගු කාලීන සහ කෙටි කාලීන වගකීම් විශාල ප්‍රමාණයක් ගෙවීමට නොහැකි වී ඇත. සංස්ථාවේ පැවති මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් පසුගිය වසර කිහිපය තුලම නිසි වේලාවට වතුයායන්වලට අවශ්‍ය පොහොර යෙදීමට නොහැකි වීම තුළින් තේ දළු	ගෙවිය යුතු දිගුකාලීන ශේෂයන් නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය.

	ශේෂයක්ද රු.221,977,368 ක බැංකු ණයක් හා රු.2,452,494 ක බැංකු අයිරාවක්ද වූ අතර සංස්ථාව ඌන කාරක ප්‍රාග්ධන ගැටළුවකට මුහුණපා ඇති බව නිරීක්ෂණය විය.	අස්වැන්න අඩුවීම, වතු කම්කරු වැටුප් 2021 සහ 2024 වසරවල 35% ක පමණ ප්‍රමාණයකින් වැඩිවීම වැනි කරුණු සංස්ථාව තුල මූල්‍ය අර්බුදයක් ඇතිවීමට ප්‍රධාන හේතූන් විය. මෙම අයහපත් තත්ත්වය මගහරවාගෙන සංස්ථාවේ ආදායම් වැඩිකර ගැනීම සඳහා වතුයායන්ට අවශ්‍ය කරන පොහොර ලබාදීමට මේ වන විට අප ප්‍රමුඛතාවය ලබා දී ඇත. ඒ අනුව ඉදිරි කාලයේදි සංස්ථාවේ තේ අස්වැන්න වැඩි කර ගැනීමට හැකිවෙතැයි අපි අපේක්ෂා කරමු.	
(ආ)	කැලෑබොක්ක වතුයායේ ස්වභාවික පිහිටා ඇති 360 නැරඹුම් ස්ථානය දෙස් විදෙස් සංචාරකයන් පැමිණෙන ස්ථානයක් වන අතර කඳවුරු බැඳ නවාතැන් ගැනීමට ද හැකියාවක් පවතී. වසරකට රු.600,000කට වැඩි ආදායමක් උපයන එම ස්ථානය වෙත ගමන් කිරීමට ඇති කි.මී.06 ක පමණ දුර 2024 පෙබරවාරි 29 දින වන විට ඉතා අබලන් තත්ත්වයේ පැවතුනු අතර නැරඹුම් ස්ථානය අවට පිරිසිදු කර නොතිබුණි. ඉදිකර තිබූ තාවකාලික ආවරණ දිරාපත් වෙමින් පැවතුන අතර කඳවුරු බැඳ රාත්‍රිය ගත කිරීමට පැමිණෙන සංචාරකයින් සඳහා සනීපාරක්ෂක පහසුකම් ද නොතිබුණි. සංචාරකයන් සඳහා අවශ්‍ය පහසුකම් අවම වීම හේතුවෙන් 2023 වර්ෂයේදී රු.663,000 පමණ ආදායමක් ලැබූ මෙම ස්ථානයෙන් 2024 වර්ෂයේදී ආදායම රු.424,600 දක්වා එනම් සියයට 36 කින් පමණ පහත වැටී තිබුණි.	කැලෑබොක්ක 360 නැරඹුම් මධ්‍යස්ථානය පිහිටා තිබෙන්නේ කඳුමුදුනෙහි බැවින් ස්වාභාවික ජල උල්පත් මගින් ජලය සපයා ගැනීමට අපහසුය. තවද, මෙම ස්ථානයේ විදුලිබලය නොමැති හෙයින් ජල පොම්පයක් ක්‍රියාත්මක කිරීමට ද නොහැකිය. නමුත් මෙම නැරඹුම් මධ්‍යස්ථානය සඳහා සපයා ඇති පහසුකම් ඉදිරියේදි වැඩිදියුණු කිරීමට අප බලාපොරොත්තු වෙමු. තවද, එම ස්ථානයට ලගා වීම සඳහා ඇති කිලෝමීටර් 06 ක පමණ මාර්ගය පිළිසකර කිරීම සඳහා ඇස්තමේන්තුවක් සකස් කොට එය පළාත් මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	නැරඹුම් මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය පහසුකම් සැකසිය යුතුය.
(ඇ)	ඕපල්ගල වතුයායට අයත් වන කළමනාකරණ සැලැස්ම අනුව 2022 අස්වැන්න ලබා ගත යුතු ගස් 300 විකිණීම සඳහා 2024 දී මිලගණන් කැඳවා තිබූ අතර ටෙන්ඩර්කරුවන් මිල ඉදිරිපත් කර තිබුණේ තක්සේරු මිලට වඩා රු.2,299,822 ක් අඩුවෙනි. ඊට හේතු ලෙස ටෙන්ඩර් දක්වා තිබුණේ ගස් පැරණි වීම නිසා දැවමය වටිනාකම ඇති කාලය ඉක්මවා තිබීම හා ගම් ශ්‍රාවය වීම ආදී කරුණු වූ අතර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් කරන	ඕපල්ගල වතුයාය නකල්ස් රක්ෂිතයට සහ ස්වරාක්ෂක කලාපයට යාබදව පිහිටා තිබීම නිසා ගස් කැපීම සඳහා අනුමැතීන් ලබාදීමට විශාල කාලයක් ගතවීමත්, මෙම වතුයාය සංස්ථාවේ අනෙකුත් වතුයායන්ගෙන් වෙන්ව ශුෂ්ක කලාපයට අයත්ව තිබීම නිසා අධික උෂ්ණත්වය සහ කාලගුණික බලපෑම් හේතු කොටගෙන මෙම ගස්වල අභ්‍යන්තරයේ භෞතික සැකැස්මට විශාල ලෙස හානි සිදුවේ (ඉරිතැලීම්, පැලීම්) එබැවින් සංස්ථාව සතු අනෙකුත් වතුයායන්වල ඇති ගස් හා සම වයසේ වුවත් මෙම ගස් දැව වටිනාකම අතින් අඩුවීමට මෙය ප්‍රධාන හේතුවක් විය.	වන කළමනාකරණ සැලැස්ම අනුව ගස් වල දැවමය වටිනාකම ඇති කාලය තුළ විකිණීමට කටයුතු කළ යුතුය.

	ලද ස්ථානීය පරීක්ෂාවෙන්ද එය තහවුරු වී තිබුණි. වන කළමනාකරණ සැලැස්මට අනුව එම ගස් වසර 42 කට පෙර සිටුවන ලද ඒවා වූ අතර දැව වටිනාකම ලබාගත හැකි කාලයේදී විකිණීමට කළමනාකරණයේ අවධානය යොමුව නොතිබුණි.		
(ඈ)	ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ 03/2019 මාර්ගෝපදේශය ප්‍රකාරව හෙක්ටයාරයක සම්මත තේ ගස් ප්‍රමාණය 12,500 කි. කොටගහ රාජ්‍ය වතුයායේ වාර්තා අනුව හෙක්ටයාර 221.12 ක තේ ගස් 1,101,683 ක් හා රංගල වතුයායේ වාර්තා අනුව හෙක්ටයාර් 135.79 ක තේ ගස් 1,216,089 ක් පවතින බව දක්වා තිබුණි. තේ පර්යේෂණ ආයතනයේ සම්මතයන්ට අනුව කොටගහ වතුයායේ භූමි ප්‍රමාණය අනුව තේ ගස් 2,764,000 ක් ද රංගල වතුයායේ භූමි ප්‍රමාණය අනුව තේ ගස් 1,697,375 ක් පැවතිය යුතු වුවද දැනට පවතින්නේ කොටගහ වතුයායේ ඉන් 40% ක් හා රංගල වතුයායේ 72% පමණි. ඒ අනුව කොටගහ හා රංගල වතුයායන්හි තේ වගා කර ඇති භූමියන්හි සම්මත තේ ගස් ප්‍රමාණය නොතිබුණි.	මැද රට කලාපයේ පවතින බෑවුම් තත්වය අනුව, සාමාන්‍ය වශයෙන් හෙක්ටයාර 01 ට සම්මත තේ ගස් සංඛ්‍යාව 12,500 ක් ලෙස නිවැරදි විය යුතුය. එලෙසම කොටගහ වතුයායේ දළ වශයෙන් හෙක්ටයාරයකට පවතින තේ පඳුරු සංඛ්‍යාව 4982කි. මෙය හුදෙක්ම වර්ෂ 100ට වඩා ඉපැරණි ඇට තේ වගාවන්වල තේ පඳුරු පරිහානියට ලක්වීම නිසා සිදුවූවකි. එලෙසම රංගල වතුයායේ ඇට තේ 1 ක හෙක්ටයාරකට ඇති තේ පඳුරු සංඛ්‍යාව අනුව, 18% ක ප්‍රමාණයක් පමණක් ඇති අතර, රිකිළි තේ සඳහා 74.26% ක ප්‍රමාණයක් පමණ ඇත. මෙහි දී ඇට තේ වගාවන් නඩත්තු කිරීම ප්‍රායෝගිකව ලාභ තත්වයක් නොවන අතර, එම ඉඩම් තේ පර්යේෂණ ආයතනයේ උපදෙස්වලට අනුකූලව, තේ පඳුරු ගලවා පස සාරවත් කොට නැවත, වගාකළ යුතුය. එලෙසම රිකිළි තේ වගාවන්වල කප්පාදු වක්‍රයේදී, මැරී ඇති පැළ නැවත සිටුවා යාවත්කාලීන කළ යුතු වේ.	හෙක්ටයාරයකට පැවතිය යුතු තේ ගස් ප්‍රමාණය සිටුවීමට කටයුතු කළ යුතුය.
(ඉ)	තේ පර්යේෂණ ආයතනයේ මාර්ගෝපදේශ අංක 2021/4 අනුව වසරකට හෙක්ටයාරයකට යෙදිය යුතු පොහොර ප්‍රමාණය 2022 හා 2023 වසරවල නොයෙදීම නිසා නියැදි පරීක්ෂාවට ලක් කල කොටගහ හා රංගල වතුයායන්හි තේ අස්වැන්න පිළිවෙලින් සියයට 28 කින් හා සියයට 35 කින් පහත බැස තිබුණි.	අප සංස්ථාවේ මූල්‍ය ශක්තිය අනුව 2020, 2021 වර්ෂවල දී වතුයායන් වෙත පොහොර ප්‍රමාණයන් ලබාදෙන ලදි. ඊට සාපේක්ෂව දළු අස්වැන්න ද වැඩිවිය. කෙසේ වෙතත්, 2023 වර්ෂයේ පොහොර මිල යම් ප්‍රමාණයකට අඩුවීම හේතු කොට ගෙන, පොහොර කිලෝ 128,000 කට ආසන්න ප්‍රමාණයක් යෙදීමට හැකියාව තිබුණි. නමුත් ආදායම් ලබන තේ ක්ෂේත්‍රයන් සඳහා මෙය 20% ක ප්‍රමාණයක් වේ. එයට සාපේක්ෂව තේ අස්වැන්න ද පහත බැස ඇත.	හෙක්ටයාරයකට යෙදිය යුතු පොහොර ප්‍රමාණය යෙදිය යුතුය.
(ඊ)	තේ නැවත වගාව ව්‍යාපෘතිය යටතේ කොටගහ වතුයායේ හෙක්ටයාර 20.16 ක හා රංගල වතුයායේ හෙක්ටයාර 26.43 ක පිළිවෙලින් පැල 252,000 ක් හා 330,000 ක් සිටුවා තිබුණි. තේ පර්යේෂණ ආයතනයේ 2000 ජූලි නිකුත් කර ඇති 00/2 උපදේශන චක්‍රලේඛය අනුව පලමු	පොහොර මිල කීප ගුණයකින් ඉහළ යෑම හේතු කොට ගෙන 2022 සහ 2023 වර්ෂයේ නව වගාවන් සඳහා පොහොර යෙදීම ඉතාම අවම මට්ටමකට පත්විය. මෙහිදී කොටගහ සහ රංගල වතුයායන්ට පිළිවලින් පැළ සඳහා පොහෙර අවශ්‍යතාවයෙන් 39% ක් සහ රංගල වතුයායේ පැළ සඳහා 6.28%ක පමණ අවම පොහොර ප්‍රමාණයක් සංස්ථාවේ මුදල්	තේ පැල සඳහා අවශ්‍ය පොහොර ප්‍රමාණය යෙදිය යුතුය.

	වසරේ පැල සඳහා හෙක්ටයාරයකට පොහොර කි.ග්‍රෑම් 1,100 ක් හා දෙවන වසරේ පැල සඳහා හෙක්ටයාරයකට පොහොර කි.ග්‍රෑම් 1,600 යෙදිය යුතු වුවත් කොටගහ වතුයායේ පැල සඳහා පොහොර අවශ්‍යතාවයෙන් 39% ක් ද රංගල වතුයායේ පැල සඳහා 6.28% ක් ද යොදා තිබුණි.	ප්‍රවාහය මත මිලදී ගෙන යෙදීම සිදු කරන ලදි.	
(උ)	2022 නොවැම්බර් මස සිට අලුත්වැඩියා කටයුතු සඳහා වසා දමා ඇති රංගල වතුයායේ තේ කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු ඇරඹීමට අවශ්‍ය යන්ත්‍රෝපකරණ ඇතුළු අනෙකුත් පහසුකම් සැපයීමට 2025 ජනවාරි 24 දින වන විටත් සංස්ථාව අපොහොසත් වී තිබුණි. නිෂ්පාදන කටයුතු ඇරඹීමට අවශ්‍ය කටයුතු වලින් 80% ක් පමණ නිම වී තිබුණ ද තේ නිෂ්පාදනය සඳහා අවශ්‍ය යන්ත්‍ර සැපයීමට නොහැකි වීම මත මෙම ප්‍රමාදය සිදුවී ඇති බව නිරීක්ෂණය විය.	2022 වර්ෂයේ තේ කරමාන්තශාලාවේ ලිප කොටස අධික ලෙස අබලන්වීම සිදුවිය. එය තුලින් කර්මාන්තශාලාව ගින්නෙන් විනාශ වීම වලක්වා ගැනීම වස් කර්මාන්තශාලාවේ වැඩ වහාම නතර කෙරිණි. මෙම කර්මාන්තශාලාව 1984 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වාම නවීකරණය කිරීමක් සිදුකර නොතිබිණි. ඒ අනුව නවීන වෙළඳපලට අනුව ගුණාත්මක තේ නිෂ්පාදනය කිරීමට නම්, මීට සමගාමීව කර්මාන්තශාලාව නවීකරණය කලයුතු බවට තේ පරීක්ෂණ මණ්ඩලයෙන්ද යෝජනා විය. කර්මාන්ත ශාලාවේ ඉතිරි නවීකරණ වැඩ කටයුතු ඉදිරියේ දී සංස්ථාවේ මූල්‍ය ශක්‍යතාවය අනුව හැකි ඉක්මනින් නිමකර නිමි තේ නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.	කඩිනමින් වැඩ අවසන් කර කර්මාන්ත ශාලාවේ කටයුතු ආරම්භ කළ යුතුය.
(ඌ)	2020 සිට 2021 වර්ෂය දක්වා කාලය තුල නැවත දැවමය ගස් වගා කරන ලද රංගල කල්දූරියා කොටසේ ගම්පැල 2,600 ක්, යුකැලිප්ටස් 1,732 ක්, කැසියා 250 ක් හා කුඹුක් පැල 10 ක් සිටුවීමට රු. 1,065,150 ක මුදලක් වැයකර තිබුණද එම පැල සිටුවා නොතිබූ බව විගණනයේදී තහවුරු විය.	මෙම කරුණ සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම සඳහා අපහට දුෂ්කර වීමට හේතුව වී ඇත්තේ එම වතුයායේ එවකට වතු අධිකාරී ලෙස සේවය කල වතු අධිකාරී ඒ.සී. අබේවර්ණ මහතා මේ වනවිට ජීවතුන් අතර නොසිටීමටත්, සහකාර වතු අධිකාරී ලෙස කටයුතු කල සී.ජේ. මාපා මහතා මේ වනවිට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා සේවයේ නොමැති වීමත්ය. නමුත් මේ වනවිට අප විසින් තොරතුරු සොයා බලමින් සිටින අතර, එම තොරතුරු ලබාගත් වහාම ජාතික විගණන කාර්යාලය වෙත යොමු කිරීමට අපේක්ෂා කෙරේ.	මේ සම්බන්ධ වගකිව යුතු නිළධාරීන් හඳුනාගෙන වැයකල මුදල අය කරගත යුතුය.
(එ)	වලහන්දුව රාජ්‍ය වතුයාය නවීන තාක්ෂණය යොදාගනිමින් ආදර්ශ වතුයායක් ලෙස සංවර්ධනය කිරීමේ වගා ව්‍යාපෘතියට අදාලව 2022 හා 2023 වර්ෂ වලදී සිදුකරන ලද පොල්, කුරුඳු හා තේ වගාවන් පිළිබඳව 2024 මැයි මාසයේදී සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී සිටුවන ලද පොල් පැල 1551 න් පැල 1114 ක් එනම් සියයට 72 ක්ද, සිටුවන ලද කුරුඳු පැල 28,800 න් 21,488 එනම් සියයට 75	වලහන්දුව වතුයාය ආදර්ශ වතුයායක් ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් පැවති කාලයේ සේවයේ නියුතුව සිටි වැඩබලන වතු අධිකාරීවරයා සහ ක්ෂේත්‍ර නිළධාරීන් මෙම ව්‍යාපෘතිය නිසි ලෙස අධීක්ෂණය නොකිරීම හේතුවෙන් වැඩබලන වතු අධිකාරීවරයාගේ එම තනතුර ඉවත් කොට ඔහුගේ නිත්‍ය තනතුර වන සහකාර වතු අධිකාරී ලෙස කැලෑබොක්ක රාජ්‍ය වතුයාය වෙත ස්ථානමාරුවක් ලබාදී ඇත. ක්ෂේත්‍ර නිළධාරීන් දෙදෙනාගෙන් එක් අයෙකුගේ සේවය දැනට අත්හිටුවා ඇති අතර, අනෙක් ක්ෂේත්‍ර නිළධාරියා දැනට වතුයායේ සේවය	වගකිව යුතු නිළධාරීන්ගෙන් අලාභයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

	ක් හා සිටුවන ලද තේ පැල 27,500 න් සියයට 51 ක් වගා භූමිය තුල නොමැති බව තහවුරු කර තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කාලයේ සේවයේ නියුතුව සිටි වැඩ බලන වතු අධිකාරි හා ක්ෂේත්‍ර නිලධාරීන් නිසි ලෙස අධීක්ෂණය නොකිරීම හේතුවෙන් මෙය සිදුව ඇති බව කළමනාකරණය පිලිගෙන ඇති අතර ඊට අදාළ වියදම ඔවුන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	කරනු ලබයි. ඔවුන් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණකගේ පරීක්ෂණ වාර්තාව අනුව සුදුසු කටයුතු කරනු ඇත.	
(ඒ)	සංස්ථාව සතු වතුයායන් මැනුම් කටයුතු සිදුකිරීමේදී වතුයායන් 06 ක ගැසට් මඟින් ලද ඉඩම් ප්‍රමාණයට වඩා හෙක්ටයාර් 1,112 ක් අඩුවෙන්ද එක් වතුයායක හෙක්ටයාර් 3.19 ක් වැඩියෙන්ද තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.	අඩුවෙන් සටහන් වී ඇති වතු 05 නැවත මැණුම් කර වඩාත් නිවැරදි මැනුමක් ලබාදෙන ලෙසට අප විසින් අප අමාත්‍යාංශය වෙත ලිඛිත ඉල්ලීමක් සිදු කර ඇත. එය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතී. ගැසට් පත්‍රයේ සඳහන් ප්‍රමාණයට වඩා වැඩිපුර ප්‍රමාණයක් වාර්තා වී ඇති හුන්නස්ගිරිය වතුයායේ ඉඩම් ප්‍රමාණය ගැසට් පත්‍රයට ඇතුලත් කිරීමේ දී මැනුමක් සිදු කර නොමැති කාරණය නිසා එසේ අඩු අගයක් සටහන් වී ඇති බවට විශ්වාස කරමු.	සන්තක ඉඩම් නිවැරදිව මැන ගැනීමට කටයුතු කළ යුතුයි.

3.3 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන පොදු ව්‍යාපාර සඳහා මාර්ගෝපදේශයේ 3.2 ඡේදය අනුව බඳවාගැනීම් හා උසස්කිරීමේ කාර්ය පටිපාටිය ප්‍රාථමික තනතුරුවලට හැර 2024 දෙසැම්බර් 31 දින වන විටත් සංස්ථාව අනුමත කරවාගෙන නොතිබුණි.	බඳවා ගැනීම් හා උසස් කිරීමේ කාර්ය පටිපාටිය සම්බන්ධව මේ වන විට ප්‍රාථමික තනතුරු සඳහා පමණක් කළමණාකාර සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමැතිය ලබා දී ඇති අතර ඉතිරි තනතුරු සම්බන්ධව අනුමැතිය ලබාදී නොමැත. නමුත් 2019 පැවැති රජය මගින් අප සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීමට නියමිතව තිබූ බැවින් මේ සඳහා අනුමැතිය හිමි නොවුන අතර අද වන විට අප රාජ්‍ය වැවිලි සංස්ථාව සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය ඒකාබද්ධ කිරීමට නියමිත බැවින් ඒ අනුව මෙම අනුමත කිරීම් ඉදිරියේ දී සිදු කරන බව දන්වා සිටින ලදී.	බඳවා ගැනීම් පටිපාටිය අනුමත කරවා ගත යුතුයි.